**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


නිවේදන අංකය : **01** WW/T/19/11/03/01
වර්ණය : රතු

# ප්‍රභල අකුණු පිළිබඳව අනතුරු ඇඟවීමේ නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2019 නොවැම්බර් මස 03 වන දින රාත්‍රි 10.30 වන තෙක් වලංගු වන පරිදි
2019 නොවැම්බර් මස 03 වන දින ප.ව. 02.30 ට නිකුත් කරන ලදී.

## <u>ගොඩබිම් ප්‍රදේශ සඳහා</u>

## විමසිලිමත් වන්න !

**මධ්‍යම, සබරගමුව, දකුණු, බස්නාහිර, ඌව සහ වයඹ සහ පළාත්වලත් අනුරාධපුර සහ මන්නාරම දිස්ත්‍රික්කවලත් තැනින් තැන සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ ගිගුරුම් සහිත වැසි සමග ප්‍රභල අකුණු ඇතිවීමේ වැඩි හැකියාවක් පවතී.**

**ගිගුරුම් සහිත වැසි සමග පැ.කි.මී. 70-80 ක පමණ කෙටිකාලීන තද සුළං ද ඇති විය හැක.**




## ආරක්ෂිත පියවර:

අකුණු සහ ගිගුරුම් පවතින අවස්ථාවල පහත ආරක්ෂිත පියවරයන් අනුගමනය කරන මෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මහජනතාවට අවවාද කෙරේ.

- එළිමහනේ හෝ ගස් යට නොසිටිය යුතු අතර ආරක්ෂිත ගොඩනැගිල්ලක් හෝ සංවෘත වාහනයක් තුළ රැඳී සිටින්න.
- කුඹුරු, තේ වතු, ක්‍රීඩා පිටි මෙන්ම ජලාශ වැනි විවෘත ස්ථාන වල රැඳී සිටීමෙන් වලකින්න.
- රැහැන් සහිත දුරකථන සහ විදුලියට සම්බන්ධ කරන ලද විදුලි උපකරණ භාවිතයෙන් වලකින්න.
- බයිසිකල්, ට්‍රැක්ටර් සහ බෝට්ටු වැනි විවෘත වාහන භාවිතයෙන් වලකින්න.
- තද සුළං හේතුවෙන් ගස් හා විදුලි රැහැන් බිම ඇද වැටීමට ඉඩ ඇති බැවින් ඒ පිළිබඳව සැලකිලිමත් වන්න.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.